# නිදහස ලැබූ බුරුම සිරකාරිය - සූකී

**නෙ**ල්සන් මන්ඩේලාගෙන් පසුව ලොව වඩාත් කතාබහට ලක්වූ දේශපාලන සිරකාරිය වූ බුරුමයේ අවුන් සාන් සූකී මහත්මිය(Aung San Suu Kyi) පසුගිය නොවැම්බර් 13 වන දින නිදහස ලැබුවා ය. 1989 සිට මේ දක්වා ගතවූ වසර 21 තුළ වරින් වර පුරා වසර 15 ක කාලයක්ම ඇය සිටියේ සිරගතව ය. මෙම කාලය තුළ ඇයට පෞද්ගලික ජීවිතයේද, දේශපාලන ජීවිතයේද බොහෝ දේවල් අහිමි විය. 1990 බුරුමයේ රාජ්‍ය නායිකාව වීමට තිබූ වරම අහිමි විය. 1990 දී **Rafto** සම්මානයද, 1991 දී නොබෙල් සාම ත්‍යාග යද, 1992 දී ජවහර් ලාල් නේරු සම්මානයද, 2005 දී **Olaf Palme** සම්මානයද හිමිවුණු කල ඇය එම පිරිනැමීමේ උළෙලවල් කිසිවකටවත් සහ භාගිවීමේ අවස්ථාවක් නොලද් දීය. ඇයට ලැබුණේ පෙර අපර දෙදිග රට වලින් ලැබුණු ජනතා අනුකම්පාව හා ජනප්‍රසාදය පමණි.

1993 දී ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ දී වාසුදේව නානායක්කාර මහතා ගෙන ආ පෞද්ගලික යෝජනාවක් අනුව අවුන් සාන් සූකී වෙත සහයෝගතාව පළකෙරිණ.

දෙවන ලෝක යුද සමයේ බුරුමයේ වීර, එමෙන්ම ජනප්‍රිය යුද සෙන්පතියෙකුව සිටි අවුන් සාන් රජයේ හෙදියක වන මා කින් කී සමග 1942 සැප්තැම්බර් 6 වන දින විවාහ වූයේය. ඔවුන්ට දරුවන් තිදෙනෙකි. ලොකු පුතා සන් යූ 1943 දීත්, සන් ලින් 1944 දීත්, දියණිය සූ කී 1945 දීත් ය.

ප්‍රජාතන්ත්‍රවාදය පාදක කරගත් පාලන ක්‍රමයකට නැඹුරුවූ අවුන් සාන් සෙන් පතිවරයා 1947 ජූලි මස 19 වන දින විරුද්ධවාදීන් විසින් ඝාතනය කරන ලදී. එවිට සූකීට වයස අවුරුදු 2 ලැබුවා පමණි. පවුලේ දෙවන දරුවා වූ අවුන් සාන් ලින් වයස අවුරුදු 9 දී රැන්ගුන් නුවරදී ජලාශයක වැටී මිය ගියේය.

මේ වන විට බුරුමයේ අභ්‍යන්තර පරිපාලනය හා දේශපාලනයේ වියවුල් රැසක් ඇතිවිය. මුළු බුරුම රටේ සෑම දෙයක්ම හමුදා ග්‍රහණයට හසුවිය. මේ තත්වය යටතේ ඝාතනයට ලක්වූ අවුන් සාන් සෙන්පතිවරයාගේ අනුගාමික පිරිස ඔහුගේ වැන්දඹු බිරිඳ වටා ඒකරාශී වන්නට පටන්ගත්හ.





සූකී හා මයිකල් විවාහ වූ දා

මෙය නොරිස්සූ හමුදා පාලකයෝ උපක්‍රමශීලි ලෙස මා කින් කී මැතිණිය ඉන්දියාවේ බුරුම තානාපතිවරිය ලෙස පත්කර යැවූහ. බුරුමයේ තානාපති සේවයට පත්වූ ප්‍රථම කාන්තාව ඇය යි. අවුන් සාන් සූකී ද සිය මව සමග ඉන්දියා-වට පැමිණි අතර එහිදී නර්තනය හා සංගීතය හැදෑරූ ඇය තානාපති නිලධාරීන්ගේ දරුවන් අතර සූකී කැපී පෙනෙන චරිතයක් වූවාය.

එවකට ඉන්දියාවේ සිටි බ්‍රිතාන්‍ය තානාපති පෝල් ගෝර් බූත්ගේ ( Paul Gore Booth) අවධානය ලක්වූ ඇයට ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයට ඇතුළ්වීමට අවස්ථාව හිමි විය. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ සෙන්ට් හියුස් විද්‍යාලයට ( St Hugh's College) වෙතට 1964 දී ඇතුළත්ව දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ දර්ශනය හැදෑරූ සූකී කැපී පෙනෙන ශිෂ්‍යාවක වූවා ය. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ආසියාතික අධ්‍යාපන අංශයේ කථිකාචාර්‍ය වරයෙකු වූ මයිකල් එරිස් සමග ඇය ඇතිකර ගත් ප්‍රේම සම්බන්ධයට ඇගේ මව විරෝධය දැක්වූ නිසා සූකීට සිදුවූයේ සාමාජීය හා සංස්කෘතික ගැටළුවලට මුහුණදීමට ය.

මයිකල් එරිස් (Michael Aris) සමග විවාහ වීමට ප්‍රථම ඇය ලිපියක් ලියා ඔහුගෙන් ඉල්ලා සිටියේ " ඉංග්‍රීසි ජාතිකයෙකු වන ඔබ හා විවාහවීමෙන් පසුවද මට මගේ බුරුම ජාතිකත්වයත් බුරුම ජනතාවත් අමතක කර ලීමට ඉඩ නොතැබිය යුතුයි " කියාය. එයට මයිකල් එකඟවීමෙන් පසුව 1972 ජනවාරි 1 වෙනි දින ලන්ඩන්හි චෙල්සි නගර ශාලාවේ දී (Chelsea Town Hall) දෙදෙනා ථෙරවාද බෞද්ධ චාරිත්‍රවලට අනුව විවාහවූහ. ඉන්පසු එම යුවල ඉන්දියාව, භූතානය, නේපාලය වැනි රටවල විවිධ ආයතනයන්හි සේවය කළ අතර, පදිංචිය ලෙස ඔක්ස්ෆර්ඩ් තෝරා ගත්හ. එක්සත් ජාතීන්ගේ කාර්‍යාල වල සේවය කළ නිසාම භූතානයට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබාගැනී මට සූකී විශාල කාර්‍යභාරයක් ඉටු කළා ය.

ඔවුන්ට ඇලැක්සැන්ඩර් (1973) හා කිම් (1977) නමින් පුතුන් දෙදෙනෙකි. ඔව්හු මව ඇසුරේ වැඩුණාහ. මේ අතර තම මවට උවටැන්කිරීමට බුරුමයට ගිය සූකීට සිදුවූයේ අසහනයෙන් පෙලෙමින් සිටි බුරුම ජනතාවට නායකත්වය දීමටය. 1988 දී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජාතික සංගමය (National League for Democracy) පිහිටුවාගෙන ඇය එහි දේශපාලනයට අවතීර්ණ වූවාය. මේ නිසා ඇයට සිරභාරයට පත්වන්නට සිදුවිය. ඒ අතරේ වූ අනෙක් අවාසනාවන්ත සිද්ධිය නම් ඇගේ සැමියා මයිකල් බ්‍රිතාන්‍යයේ සිටියදී පිළිකා රෝගයට ගොදුරුවීමයි. සැමියා බැලීමට යාමට බුරුම රජය ඇයට අවසර දුන්නද සූකී නොගියේ ගියා නම් යළිත් මව් රටට එන්නට ඉඩ නොදේය යන බිය නිසා ය. " මට මගේ සැමියා නැති වේවි. එහෙත් මගේ බුරුම සගයින්ට ස්වාමියා පමණක් නොව දෙමව්පියන්ද, දරුවන්ද දහස්ගණනින් අහිමි වී ඇත" යි සූකී කියා සිටියා ය.

1999 දී සැමියා වන මයිකල් මියගිය අතර ඇය ජීවිතයේ තවත් සිරකාරියක වූවා ය. රැන්ගුන් නුවර විශ්වවිද්‍යාල මාවතේ අංක 54 නිවසේ දේශපාලන සිරකාරියක ලෙස වසර 15 ගත කළ ඇය ජීවිතේ අනේක මානසික ව්‍යසනයන්ට ගොදුරුවූවා ය. **අවුන් සාන් සූකී** යන වචනවල අර්ථය **ජයග්‍රාහී**, **චමත්කාර**, **දීප්තිය** යන්නයි. එයට සරිලන සේ ඇය කෙමෙන් කෙමෙන් බුරුමයේ නායකත්වයට ළඟාවෙමින් සිටී.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාව සිටි ඌතාන් මහතා බුරුම ජාතිකයෙකි. ඔහු වරක් හමුදා පාලක යන්ට දන්වා සිටියේ අවුන් සාන් සූකීගෙන් රටට ප්‍රයෝජනයක් ලබාගන්නා ලෙසයි. ඇය සිරකර තැබීම බුරුම ජාතිය සිරකර තැබීමක් බව ද ඔහු පැවසී ය.

අවුන් සාන් සූකී මහත්මිය බෞද්ධ වත් පිළිවෙත් රකින්නියකි. ඒ නිසාම ඇය ඉතා ආදර්ශවත් ප්‍රජාතන්ත්‍රවාදී පාලිකාවක වනු ඇතැයි අපට සිතේ.

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Major V. B. Karunaratne**
***Oxford UK***

# නත්තල සහ අම්මා...



**දෙ**සැම්බර් මස **25** වන දා එනම් නත්තල් දිනය ලොව පුරා විශේෂ දිනයක් බව අපි කවුරුත් දනිමු. ඒ දිනය මට ද විශේෂ අමතක නොවන දිනයක් වෙයි. අපේ අම්මා මෙලොව හැර ගියේ එදිනය. අම්මා නැතිවී මේ **25** දිනට හරියටම වසර **25** ක් වෙයි. මේ කාලය මුළුල්ලේ මට අම්මා සිහි නොවූ එකම දවසක් වත් නැත.

මගේ සිතින් කිසිදා බැහැර නොයන එක් මහා දුකක් වෙයි. ඒ අම්මාගේ අවසාන මොහොතේ මට ඒ අසල සිටින්නට බැරිවීමයි. නැතිවන දිනයේ උදෑසන මා එන්නේ දැයි අම්මා ළඟ සිටි අයගෙන් අසා ඇත. මා එනු ඇතැයි අම්මා සිතන්නට ඇතුවා නිසැකය. ඇයට තම දරුවන්ගෙන් දැක ගන්නට බැරිවුණේ මගේ මුහුණ පමණකි. අම්මාගේ සිතේ කොපමණ දුකක් තිබෙන්නට ඇත්දැයි මට සිතාගත හැකිය.

එකල දැන් මෙන් ශ්‍රීලංකාවට දිනපතා යන ගුවන් සේවා තිබුණේ නැත. විශේෂයෙන් නත්තල් දිනයේ අසුනක් ලබා ගැන්ම ඉතා දුෂ්කර කාර්‍යයකි. මට යන්නට ටිකට් පතක් සොයා දෙන්නට එදා මගේ මිතුරෝ නොයෙක් අයුරින් මහන්සි ගත්හ. ඒ වැයම් සියල්ල නිශ්ඵල විය.

ගිය සතියේ මගේ මිතුරෙක් ඔහුගේ අම්මාට අසනීපයයි අසා ලංකාවට ගියේය. යන්නට පෙර ඔහු මට ඒ බව කීවේය. මම ඔහුගේ පියවර අතිශයින් පැසසුවෙමි. අම්මා තවමත් සිටිනවා නම් ඒ වාසනාවක් නොවේද? මේ සියළු ස්නේහයන් සසරට බැඳ තබන බැමි බව සැබෑය. එහෙත් දෙමාපියන් නැතිව අපට සසර බැඳීමෙන් ඉවත්වන ඥාණයට සමීප වන්නට බැරිය. අප ඒ තැනට ඔසවා තබන්නට අප ශක්තිමත් කරන්නට අප ඉදිරියට යවන්නට ඔවුන් සිටිය යුතුය.

නින්දට යන විට මගේ හැමදාම බලාපොරොත්තුව අම්මා සිහිනයෙන් දකින්නටය. එහෙත් එය හරියන්නේ ඉතා කලාතුරකිනි. ගිය මාසයේ මම අම්මා සිහිනයෙන් දුටුවෙමි. මාද සහභාගි වූ කිසියම් උත්සවයකට අම්මා ඉතා අලංකාර සාරියකින් සැරසී ඇවිත් සිටියාය. මා ඇය දුටුවේ සෙනග අතරිනි. මා දැක අම්මා ඈත සිට සිනාසුනාය. සෙනග පීරා මා ඇය සිටි දෙසට ගිය විට අම්මා එතැන සිටියේ නැත. වට පිට හැම තැනම සෙවූ මුත් ඒ කිසි තැනක ඇය නොවීය.

අම්මා ගැන මම දැන් ශෝක නොවෙමි. ඒ මේ නිසාය. අම්මා නැවත මෙලොව ඉපදී දැන් විවාහ වන වියට පත් සුන්දර තරුණියකව සිටිනවා ඇතියි මට කල්පනාවේ. එසේ නම් මා ශෝක වන්නේ තැවෙන්නේ කුමටද?

දෙමාපියන් දරුවන්ගෙන් ඈත්වන්ට සිතන්නේ නැත. එහෙත් දරුවෝ යන්නට යති. දෙමාපියන් දරුවන්ට දක්වන ආදරයත් දරුවන් දෙමාපියන්ට දක්වන ආදරයත් අතර ප්‍රමාණිකව අති විශාල වෙනසක් තිබෙන බව මේ ළඟදී පැවසූ කාන්තාවක් සිය වදන් අවසන් කළේ මෙසේ කියමිනි.

" ඇත්තටම දෙමව්පියන්ට ඔච්චර ආදරයක් අපේ තිබුණ නම් අපි කීයටවත් ඒ අය දාලා මෙහේ එන්නෙ නෑ නේද? "

ගෙදරින් බැහැරව පිටරටකට ඒම ගැන මම ඇතැම් විටෙක තැවෙමි. පිටරටකට ආවාය කියා අප අත්පත් කරගත් විශේෂ යමක් තිබේදැයි මම විටෙක කල්පනා කරමි.

මතු අත්බවේ දිත් ඔබේ පුතණුන් වෙලා
නොගොසින් කොහේවත් ඔබේ නෙත් මානයෙන්
සුරැකී වසන්නට ලදොත් ඔබ හා රැඳී
වෙනයම් සැපක් වෙද තවත් නිවනින් මෙහා!

මා ආදරණීය මෑණියන්ට උතුම් වූ නිවන් සැප ලැබේවා!

♦ **දයා ආනන්ද**


HolidayAir
A Travel Experience to Remember
The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value New Year Deals to Colombo
Book Now! JET AIRWAYS £260+Taxes Baggage allowance - 35kg valid from 01 Jan – 30Jun 2011
SriLankan £395 +Taxes 01 Jan – 05 Feb 11 23 Feb – 06 Apr 11 24 Apr – 30 Jun 11
ETIHAD AIRWAYS £240 +Taxes 01 Jan – 30 Jun 11
GULF AIR £250 +Taxes 01 Jan – 30 Jun 11
KUWAIT AIRWAYS £260 +Taxes 01 Jan – 30 Mar 11
QATAR AIRWAYS £288 +Taxes 01 Jan – 30 Jun 11
Emirates £420 +Taxes 15 Jan – 14 Apr 11
IATA
MCG Mike Cooke Group
0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays
